සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

8 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

01 නාට්‍ය පෙළ තුළ ඇතුලත් අංගයක් නොවන්නේ,

(i) චරිත (ii) සංවාද (iii) සංගීතය (iv) රංග විධාන

02 නාට්‍යක සංවාද අයත් වනුයේ,

(i) ආංගික අභිනයටයි. (ii) වාචික අභිනයටයි.

(iii) සාත්වික අභිනයටයි. (iv) ආහාර්ය අභිනයටයි.

03 ''වලහා සහ මාෂා'' නාට්‍ය නිර්මාණය කළේ,

(i) සෝමලතා සුබසිංහ මහත්මිය විසිනි. (ii) කෞෂල්‍යා ප්‍රනාන්දු මහත්මිය විසිනි.

(iii) පාලිත ලොකුපෝතාගම මහත්මා විසිනි. (iv) ඩී. කුමාරගේ මහත්මා විසිනි.

04 නාට්‍යකට පාදක වන කතා තේමාව

(i) හැඟීම් අවුස්සන සුළු විය යුතුය. (ii) හාස්‍ය උපදවනසුළු විය යුතුය.

(iii) සදාතනික ගුණයෙන් යුක්ත විය යුතුය. (iv) එක් පිරිසකට පමණක් සීමා විය යුතුය.

05 'රූපණය' යනුවෙන් හඳුන්වන්නේ,

(i) රූප ඇඳීමයි. (ii) රූප වර්ණ ගැන්වීමයි.

(iii) රඟපෑමයි. (iv) ඉහත කිසිවක් නොවේ.

06 ''සන්තානම් පල්ලි යන්න - ලේ ලකඩි ලේලෝ

පාලවියෙන් හැරිලා යන්න - ලේ ලකඩි ලේලෝ'' මෙම ගීත කොටස අයත් වන්නේ,

(i) වැදි ගීතයකට ය. (ii) යාතුකර්ම ගීතයකට ය.

(iii) දූල් ගීතයකට ය. (iv) නව නාට්‍ය ගීතයකට ය.

07 හිස, අත්, පාද, පපුව, උකුල ආදිය හඳුන්වන්නේ,

(i) අංග යනුවෙනි. (ii) ප්‍රත්‍යංග යනුවෙනි.

(iii) උපාංග යනුවෙනි. (iv) කොටස් යනුවෙනි.

08 අභිරූපණ රංගයේදී අදාළ නොවන අභිනය වන්නේ,

(i) ආංගික අභිනයයි. (ii) වාචික අභිනයයි.

(iii) සාත්වික අභිනයයි. (iv) ආහාර්ය අභිනයයි.

09 නාට්‍යයක් රසවිඳීමේ දී ප්‍රධාන වේ

(i) සටන් ජවනිකා (ii) කතා වස්තුව (iii) නළු නිළි රූපය (iv) හාස්‍ය ජවනිකා

10 ජාතක කතාවක් ඇසුරින් නිර්මාණය කළ නාට්‍යයකි

(i) කැලණි පාලම (ii) මනමේ (iii) තට්ටු ගෙවල් (iv) තල මල පිපිලා

- **අංක 11 - 15 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

11 'පරිකල්පනය' පුද්ගලබද්ධ නොවේ. ( )

12 නාට්‍ය පෙළ තුළින් ගැටුම ඉස්මතු වේ. ( )

13 චරිතයක බාහිර මෙන්ම අභ්‍යන්තර ලක්‍ෂණ ද දැකිය හැක. ( )

14 උසස් පරිකල්පනයක් ඇති අයට ලෝකය වෙනස් අයුරකින් දැකිය නොහැක. ( )

15 රංග ක්‍රීඩාවන්හි නිරතවීමෙන් නළුවා වෙහෙසට පත්වේ. ( )

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(ශාන්තිකර්ම / නිසල රූ / භාව ප්‍රකාශනය / අධ්‍යක්‍ෂකවරයා / නළුවා / අනුශාංගික කලා / ගීත)

16 සංවාද සහ චලන රහිත රංග ඉරියව් ........................................ නම් වේ.

17 නාට්‍ය ගීතයක් ඉදිරිපත් කිරීමේ දී තාලය, ශ්‍රැතිය පමණක් නොව ........................................ ද වැදගත් වේ.

18 නාට්‍යයක් පුහුණුව සහ සංවිධානය කිරීමේදී නායකත්වය දරණ පුද්ගලයා වන්නේ ........................................ ය.

19 රංගාලෝකය, වේෂ භූෂණ ආදිය ........................................ ලෙස හඳුන්වයි.

20 උඩරට, පහතරට, සබරගමු වශයෙන් ........................................ වර්ගීකරණය වේ.

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (ලිවිය යුතු මුළු ප්‍රශ්න ගණන තුනකි.)**

01 පහත දැක්වෙන සංවාද කොටස ඇසුරින් පිළිතුරු සපයන්න.

A අනේ වලස් රාළහාමි (අඬමින්).... මට ගෙදර යන්න ඕනා. මගේ ආච්චි මම එනකන් බයේ ඇති. අනේ......

B (ඇද කරයි)

ඇ ..... / ...... හොහ් ..... හොහ් .....

A මට ගෙදර යන්න ඕ .... නා .... (අඬයි)

B හොඳයි. මම පාර කියන්නම්.... හැබැයි මං අහන ඒවට උත්තර දෙන්න ඕනා.

(i) මෙහි A සහ B යන චරිත දෙක නම් කරන්න. (ල. 02)

(ii) මෙම කොටස උපුටාගත් නාට්‍ය නම් කරන්න. (ල. 02)

(iii) ඉහත කොටසෙහි ඇතුළත් රංග විධාන 2 ක් ලියන්න. (ල. 02)

(iv) ආච්චි බයෙන් සිටින්නේ යැයි A චරිතය විසින් පැවසීමට හේතුව කුමක් ද? (ල. 02)

(v) ඔබ දන්නා ළමා නාට්‍ය 2 ක් නම් කරන්න. (ල. 02)

02 (i) වේෂ භූෂණ යන්න හඳුන්වන්න. (ල. 02)

(ii) වේෂ භූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් ලියන්න. (ල. 04)

(iii) රජ බිසව හෝ රජ චරිතයකට සුදුසු වේෂ භූෂණ ඇඳ දක්වන්න. (ල. 04)

03 (i) නළුවෙකුට තිබිය යුතු කුසලතා 2 ක් ලියන්න. (ල. 02)

(ii) නළුවෙකුට තිබිය යුතු ගුණාංග 2 ක් ලියන්න. (ල. 02)

(iii) රංග අභ්‍යාස තුළින් නළුවෙකුට ලද හැකි ප්‍රයෝජන 2 ක් ලියන්න. (ල. 02)

(iv) රංග ක්‍රීඩා 4 ක් නම් කරන්න. (ල. 04)

04 (i) යාතුකර්ම ගී යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද? (ල. 03)

(ii) යාතුකර්ම ගී ගායනා තුළ දැකිය හැකි විශේෂතා 3 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබ දන්නා යාතුකර්ම ගීයක් ලියන්න. (ල. 04)

05 ඔබ දන්නා ජන කතාවක් ඇසුරින් සංවාද, රංග විධාන සහිත සරල නාට්‍ය පෙළක් රචනා කරන්න. (ල. 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) ii (03) iv (04) iii (05) iii (06) iii (07) i (08) ii

(09) ii (10) ii (11) ✗ (12) ✓ (13) ✓ (14) ✗ (15) ✗

(16) නිසල රූ (17) භාව ප්‍රකාශනය (18) අධ්‍යක්ෂකවරයා (19) අනුශාංගික කලා

(20) ශාන්තිකර්ම

## II කොටස

01 (i) A මාෂ B වලහා

(ii) වලහා සහ මාෂා නාට්‍ය

(iii) අඬමින්, ඇද කරයි, අඬයි

(iv) මාෂා නිවසට පැමිණීමට ප්‍රමාද වීම / මාෂා නොමැති නිසා බිය වීම / මාෂාට සිදුවූ දෙය කුමක්දැයි නොදැන බියට පත්වීම

(v) නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

02 (i) නළුවන් රංගනයේදී භාවිතයට ගන්නා වස්ත්‍ර හා ආභරණ වේෂ භූෂණ නම් වේ.

(ii) නාට්‍යයට අදාල දේශයට, යුගයට ගැලපීම.
ශෛලියට අනුව නිර්මාණය කිරීම.
චරිත ස්වභාවය ඉස්මතු වන සේ නිර්මාණය කිරිම.
පහසුවෙන් ඇඳ පැළඳ ගැනීමට හැකි අයුරින් නිර්මාණය කිරීම.
ආදී වශයෙන් ලියා ඇති නිවැරදි කරුණු සඳහා ලකුණු ලබාදෙන්න.

(iii) පිළිතුර අනුව

03 (i) රංගන කුසලතාවය / ගායන කුසලතාවය

(ii) ඉවසීම / ස්ථානෝචිත ප්‍රඥාව / සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ආදී වශයෙන්

(iii) හඬ ප්‍රක්ෂේපන කුසලතාවය / මානසික ඒකාග්‍රතාවය / නම්‍යශීලී බව

(iv) මීයෝ මීමෝ / නැටි කැඩීම / පෙරළෙන ඔරුව / වෙද පුටුව ආදී වශයෙන්

04 (i) ශාන්තිකර්ම හෙවත් යාතුකර්මවලදී ගයනු ලබන ගීත යාතුකර්ම ගී ලෙස හඳුන්වයි.

(ii) රංගනයේ යෙදෙමින් ගායනය කරයි. / බෙර තාලයට අනුව ගායනය කරයි. / බෙර හඬ අභිබවා ගායනය කරයි.

(iii) නිවැරදි ගීතයක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

05 නාට්‍ය පිටපත සංවාද හා රංග විධාන සහිතව ලියා ඇත්නම් නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කොට ඇත්නම් ලකුණු අභිමත පරිදි ලබාදෙන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**දෙවන වාර පරීක්ෂණය 2019**

**8 ශ්‍රේණිය** **නාට්‍ය හා රංග කලාව** **ප්‍රායෝගික පරීක්ෂණය**

01 ඔබ කැමති අවස්ථාවක් පාදක කර ගෙන අභිරූපණ රංගනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

02 නාට්‍ය ගීතයක් රංගනය කරන්න. (ලකුණු 10)

03 සිසුන් 05 දෙනා බැගින් කණ්ඩායම් කර ගුරුවරයා අභිමත පරිදි භාණ්ඩයක් ලබා දී එය පරිකල්පනය කරමින් නාට්‍ය අවස්ථාවක් ගොඩ නගන්න. (ලකුණු 15)

04 වලහා සහ මාෂා නාට්‍යයේ කැමති අවස්ථාවක් තෝරා ගෙන පූර්ව සූදානමකින් යුතුව රංගනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

(මුළු ලකුණු 50)